# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2337/33 – 2023 මස ජුනි 24 වැනි සෙනසුරාදා – 2023.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/44.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.13 දිනැති හා අංක 2323/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් ගනේමුල්ල, කොස්සින්න, කලුවල පාර, කුරුදුවත්ත පටුමග, අංක 33/1, හි පදිංචි ජී. එල්. එච්. ජේ. චන්දක ප්‍රියදර්ශන මයා සහ කොළඹ 02, වොක්ෂෝල් වීදිය, සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27හි පිහිටි ලංකා සතොස ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

යොමු අංකය: IR/COM/04/ 2020/44

නඩු අංකය: A/30/2023

*පළමු පාර්ශ්වය*

ජී. එල්. එච්. ජේ. චන්දක ප්‍රියදර්ශන මයා,
අංක 33/1, කුරුදුවත්ත පටුමග,
කලුවල පාර,
කොස්සින්න,
ගණේමුල්ල.

*ඉල්ලුම්කරු*

(පළමු පාර්ශ්වය වෙනුවෙන් පැමිණිලිකරු සහ ඔහු වෙනුවෙන් නීතිඥ කේ. නිසංසලා මහත්මිය පෙනී සිටී.)

*එදිරිව*

*දෙවන පාර්ශ්වය*

ලංකා සතොස ලිමිටඩ්,
අංක 27, සතොස මහලේකම් ගොඩනැගිල්ල,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

*වගඋත්තරකරු*

(දෙවන පාර්ශ්වය වෙනුවෙන් කළමනාකරු මානව සම්පත් කේ. ඒ. සී. එම්. කේ. ප්‍රනාන්දු මහත්මිය පෙනී සිටී.)

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා දරන පනත්වලින් සංශෝධිත වූ, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදයේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2023.03.08 දිනැති නියෝගයේ බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

*ආරාවුලට හේතු වී ඇති කරුණු*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝග ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජෙනරාල් විසින් 2023.02.28 එවා ඇති ලිපියේ දක්වෙන්නේ ලංකා සතොස ලිමිටඩ් හි කළමනාකරණ (ප්‍රසම්පාදන) තනතුර සඳහා තෝරා ගැනීමේ දී සහකාර කළමනාකරණ (මිලදී ගැනීම්) ලෙස 2017 මාර්තු සිට සේවය කරන ලද ජී. එල්. එච්. ජේ. චන්දක ප්‍රියදර්ශන මහතාට යම්කිසි අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න වේ.

*පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය*

මෙම පරීක්ෂණය 2023.03.27 දින මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුළ සෑම දිනකම දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදී.

*ඉල්ලුම්කරු මෙසේ ප්‍රකාශ කර සිටී.*

ආයතනයේ පුරප්පාඩුවක් ව තිබූ ප්‍රසම්පාදන කළමනාකරුවකු බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත නිලධාරියෙකු එම තනතුරට බඳවා ගැනීම සඳහා සේවායෝජක ආයතනය විසින් පුවත්පත් දැන්වීම් පළ කිරීමෙන් අයදුම්කරුවන් සඳහා විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකාර තනතුරේ අවුරුදු 5ක සේවා පළපුරුද්ද දන්වා තිබීම තුළින් තමාට එම තනතුරට උසස්වීමට තිබූ අයිතිය වළක්වාලමින් කටයුතු කර ඇති බවයි. එසේ හෙයින් ඔහුට උසස්වීමට තිබූ අයිතිය වළක්වාලමින් කටයුතු කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුකර ඇති බවය.

*නිරීක්ෂණ*

1. ඉල්ලුම්කරු විසින් උසස්වීම වළක්වමින් සිදුකර ඇති බව දන්වා සිටියත් ඔහුට ප්‍රසම්පාදන කළමනාකරු තනතුරේ සම්මුඛ පරීක්ෂණයේ දී මුල් අවස්ථාවේ දී අභ්‍යන්තර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෙයින් තේරී පත් වී නොමැත. මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද්දේ 2017.10.06 වැනි දිනය.

2. නැවතත් මෙම තනතුරට 2018.07.30 දිනැති සම්මුඛ පරීක්ෂණය සඳහා ද මෙම ඉල්ලුම්කරු අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර තිබූ අතර එකී සම්මුඛ පරීක්ෂණයේ දී ද අභ්‍යන්තර ඉල්ලුම්කරුවකු වශයෙන් සපුරාලිය යුතු සුදුසුකම් නොතිබීමේ හේතුවෙන් මෙම ඉල්ලුම්කරු තේරී පත් වී නොමැත.

3. ඉල්ලුම්කරුට නිසි වේලාවන්හි ඔහුට හිමි උසස්වීම් ලබා දී ඇති බව පෙනී යයි.

4. ඉල්ලුම්කරු විසින් තමන් වසර විසිදෙක (22) කට අධික කාලයක් සේවය කර ඇති බව දන්වා සිටී.

5. කරුණු සලකා බැලීමේ දී පෙනී යන්නේ ලංකා සතොස ලිමිටඩ් ස්ථාපනය කරන ලද්දේ 2005.10.26 වැනි දිනය. නමුත් ඉල්ලුම්කරු සේවයට බැඳී ඇත්තේ 2006.04.09 වැනි දිනය. මෙයින් පෙනී යන්නේ ඔහු විසින් උසස් නිලධාරීන් නොමග යැවීමට තැත් කිරීමයි.

ප්‍රදානය

1. ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇති උසස්වීම ඔහුට නොලැබීමෙන් කිසිදු අසාධාරණයක් සිදු වී නොමැති හෙයින් ඔහුගේ මෙම ඉල්ලීම සාධාරණය කිරීමට නොහැකි බැවින් නිෂ්ප්‍රභා කරමි.

2. අමතර කිසිදු මුදලක් කිසිම පාර්ශ්වයකට හිමි නොවේ. තව ද බේරුම්කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයට හිමි නොවේ.

මෙය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්.

බේරුම්කරු.

2023 ජූනි මස 03 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

EOG 06 - 0182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.